# අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල ආර්ථික යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා නෝර්වීජියානු තානාපති කාර්යාලය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය එක්වේ

***නෝර්වීජියානු තානාපති කාර්යාලය හරහා ඩොලර් මිලියන 1.9ක පමණ ආයෝජනයක් සහිතව, මෙම ව්‍යාපෘතිය වඩාත් අවදානමට ලක්විය හැකි සහ කොන්කරන ලද කාන්තාවන් සහ පිරිමින් සඳහා යහපත් රැකියා අවස්ථා සම්පාදනය කෙරෙහි ප්‍රමුඛත්වය දෙනු ඇත. ව්‍යාපෘතිය මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ වර්ධනය වන සියල්ලන් ඇතුළත් කරගන්නා ආර්ථිකයක් සාක්ෂාත් කර ගැනීම සඳහා කෘෂිකාර්මික හා ධීවර ක්ෂේත්‍රයේ අගය දාමයන්ට සහාය වීම කෙරෙහිය .***

2022 නොවැම්බර් 10 බ්‍රහස්පතින්දා, කොළඹදී - උතුරු පළාතේ කාන්තා ගෘහ මූලිකයන්, ආබාධ සහිත පුද්ගලයන් සහ තරුණයන් ඇතුළු වඩාත් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා යහපත් රැකියා සහ ජීවනෝපාය උත්පාදනය කිරීම කේන්ද්‍ර කරගත් නව සංවර්ධන සහයෝගීතා ව්‍යාපෘතියක් සඳහා කොළඹ නෝර්වේ තානාපති කාර්යාලය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය හවුල් ගිවිසුමකට අද දින අත්සන් තැබූහ. අවදානමට ලක්විය හැකි පුද්ගලයන් සහ ව්‍යවසායයන් ප්‍රවර්ධනය කිරීම (PAVE) නම් වන මෙම ව්‍යාපෘතිය, කෘෂිකාර්මික හා ධීවර වටිනාකම් දාමයන්ට කරනු ලබන මැදිහත්වීම් හරහා සියල්ලන් ඇතුළත් කරගන්නා වර්ධනය, පෞද්ගලික අංශයේ ආයෝජන, ව්‍යවසායකත්වය සහ ඩිජිටල්කරණය යන ප්‍රධාන කුළුණු මත ගොඩනගා තිබේ.

ගැටුම් බලපෑමට ලක් වූ ප්‍රජාවන් සඳහා තිරසාර සහ සියල්ලන් ඇතුළත් කරගන්නා වර්ධන උපාය මාර්ග ප්‍රවර්ධනය කිරීමෙහිලා ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් දශකයකට වැඩි කාලයක් පුරා සිදු කරන ලද කාර්යයන් මත පදනම් වෙමින් PAVE වැඩසටහන ඉදිරි වසර තුන තුළ ක්‍රියාත්මක කරනු ලැබේ. නව ව්‍යවසායන් 100ක් ස්ථාපිත කිරීම, පවතින ව්‍යවසායන් 100ක ව්‍යාපාරික භාවිතාවන් වැඩිදියුණු කිරීම මෙන්ම පුද්ගලයන් 3,000ක් සඳහා ආදායම් උත්පාදන අවස්ථා නිර්මාණය කිරීම සහ වර්ධනය කිරීම සඳහා සෘජුව දායක වීම මෙම වැඩසටහනෙහි අරමුණයි. ඉලක්කගත ප්‍රදේශවල සැකසුම් කම්හල් පිහිටුවීම සඳහා තෝරාගත් අගය දාමවල ක්‍රියාකාරී සමාගම්වලට සහාය වීම, දේශගුණික සංවේදී මනා කෘෂිකාර්මික භාවිතාවන් හඳුන්වාදීමට සහාය වීම, පවතින සහ ආරම්භ කළ හැකි ක්ෂුද්‍ර හා කුඩා ව්‍යවසායන්ගේ හැකියාවන් වර්ධනය කිරීම, ව්‍යාපාර සංවර්ධන සේවා සහ මූල්‍ය සඳහා ක්ෂුද්‍ර හා කුඩා ව්‍යවසායකයන්ගේ ප්‍රවේශය ශක්තිමත් කිරීම සහ ඩිජිටල් පරිවර්තනය දියුණු කිරීම වැනි උපායමාර්ගික මැදිහත්වීම් PAVE හි උත්සාහයේ හරය වනු ඇත.

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග කාර්යයන් දිගටම පවත්වාගෙන යාමට ලැබීම සම්බන්ධයෙන් සතුටු වන බව මෙම හවුල්කාරිත්වය පිළිබඳව අදහස් දක්වමින් කොළඹ නෝර්වීජියානු තානාපති කාර්යාලයේ ප්‍රධානී හිල්ඩ් බර්ග්-හැන්සන් මහත්මිය ප්‍රකාශ කළාය. ඇය වැඩිදුරටත් මෙසේ ද පැවසුවාය:

*"මෙම ව්‍යාපෘතිය නෝර්වේහි කලාපීය සංවර්ධන ප්‍රමුඛතාවලට විශාල වශයෙන් අදාළ වේ. විශේෂයෙන්ම කුඩා වතු හිමියන් අතර කුසගින්න සහ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා දේශගුණික වශයෙන් සංවේදී මනා කෘෂිකර්මාන්ත භාවිතාවන් ප්‍රවර්ධනය කිරීම, රැකියා උත්පාදනය කිරීම සහ දරිද්‍රතාවය විසඳීම සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ තිරසාර ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම යන ක්ෂේත්‍රවලට එය බෙහෙවින් අදාළ වේ. ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහාය වීම සමාජයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආරක්ෂා කිරීම සඳහා ඉතා වැදගත් කාර්යයක් බව අපි තරයේ විශ්වාස කරමු. ජාත්‍යන්තර කම්කරු සංවිධානය, එහි දේශීය කණ්ඩායම සහ පෞද්ගලික අංශයේ හවුල්කරුවන් රට තුළ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය ලබාදීම සම්බන්ධයෙන් අපි සුබ පතන්නෙමු."*

උතුරු පළාතේ වඩාත්ම අවදානමට ලක්විය හැකි කාන්තාවන්, පිරිමින් සහ ආබාධ සහිත පුද්ගලයින් වෙනුවෙන් යහපත් රැකියා සහ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා නෝර්වේ හවුල්කාරිත්වය සහ අඛණ්ඩ කැපවීම ජාත්‍යන්තර කම්කරු සංගමයේ ඇගයීමට ලක්වන බව ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා වූ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අධ්‍යක්ෂ සිම්රින් සිං පැවසීය.

PAVE ව්‍යාපෘතිය පශ්චාත් ගැටුම් දිස්ත්‍රික්කවල සියල්ලන් ඇතුළත් කරගන්නා වර්ධනයට සහ ප්‍රතිසන්ධානයට සහාය වීම පිණිස යහපත් රැකියා අවස්ථා නිර්මාණය කිරීමේ කාර්යයේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙහි එක් ප්‍රතිචාරයක් වන අතර, ශ්‍රී ලංකාවට ආර්ථික හා මූල්‍ය අර්බුදයෙන් ගොඩ ඒම සඳහා දක්වන දායකත්වයක් ද වේ.